ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය - 2018

-----------------------------------------------

## 1.1 තත්ත්වාගණනය කළ මතය

---------------------------------

ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ ("විශ්වවිද්‍යාලය") 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ හා 1971 අංත 38 දරන මුදල් පනතේ විධානයන් යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනය අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මධ්‍යස්ථානය ක්‍රියා කර ඇති බව,

- විශ්වවිද්‍යාලය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- විශ්වවිද්‍යාලයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

## 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

## 1.5.2 ගිණුම්කරන අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි හා වෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථානය **(CEDPL)** සහ පශ්චාත් උපාධි පාඨමාලාවන් ද්විත්තවය සඳහා වන ආදායම රු.**32,118,829** ක් සහ වියදම වූ රු. **10,920,118** ක්, මුළු වත්කම් ප්‍රමාණය වූ රු. **117,119,585** සහ අරමුදල් මෙන්ම වගකීම් එම ප්‍රමාණයෙන්ද විශ්වවිද්‍යාල මූල්‍ය ප්‍රකශන සමඟ ඒකාබද්ධ කොට නොතිබුණි. මේ හේතුවෙන් විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන වල වර්ෂ අවසානයට වන ආදායම්, වියදම්, මුළු වත්කම් හා සම්චිත අරමුදල ඉහත වටිනාකම් වලින් අඩුවෙන් දක්වා තිබුණි. | බාහිර උපාධි හා වෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථානය **(CEDPL)** සහ පශ්චාත් උපාධි අංශයන් විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවලට ඒකාබද්ධ කර ලබන වර්ෂයේ සිට ඉදිරිපත් කිරීමට කටයුතු සිදුකරනු ලැබේ. | බාහිර උපාධි හා වෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථානයේ **(CEDPL)** සහ පශ්චාත් උපාධි අංශයේ ආදායම්, වියදම්, මුළු වත්කම් හා සම්චිත අරමුදල් විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශනවලට දැක්වීමට කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| (ii) 1995 වර්ෂයේ සිට 2017 දක්වා රජයේ ප්‍රාග්ධන ප්‍රදාන යටතේ මිල දී ගත් වත්කම් සඳහා 2017 වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දින දක්වා රු. මිලියන 1500.4 දක්වා ක්ෂය කිරීම් කර තිබූ නමුත් අදාල වත්කම් ඒවායේ ප්‍රයෝජනවත් ජීවිත කාලය තුළ ක්‍රමක්ෂය කටයුතු කර නොතිබුණි. | 1995 සිට 2017 වර්ෂය දක්වා කාලයට අදාල ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත 20 ප්‍රකාරව 1995 සිට 2017 වර්ෂය දක්වා කාලයට අදාල ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය කිරීමට කටයුතු කළ යුතුවේ. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| 2018 දෙසැම්බර් 31 දිනට අයිතමය | මූල්‍ය ප්‍රකාශන අනුව | සමීක්ෂණ මණ්ඩල වාර්තා අනුව | වෙනස | කළමණාකරනයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | සටහන් කර ගන්නා ලදී. විමසුමේ දක්වා ඇති වෙනස්කම් සැසඳීමට කටයුතු කරනු ලැබේ. | වෙනස්කම් සැසඳීමට කටයුතු කළ යුතු වේ. |
| ලී බඩු | 401,457,572 | 426,491,937 | 25,034,365 | | |
| කාර්යාල උපකරණ | 516,900,534 | 496,081,900 | 20,818,634 | | |

## 1.6 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

### 1.6.1 ලැබියයුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ණය ශේෂ, වැටුප්, බැඳුම්කර කඩකිරීම්, කොන්ත්‍රාත් සහ ආයතන යනාදියෙන් ලැබිය යුතු රු. 3,519,702 ක් අයකිරීමකින් තොරව වර්ෂ 02 සිට 17 ක පරාසයකින් හිඟහිටව තිබුණි. | විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලෙන් අයකිරීමට, වැටුපෙන් පියවන ලෙසට නිලධාරීන් සමග නීතිමය ආකාරයෙන් සන්නිවේදනය කිරීමට, සහ මූල්‍ය කමිටුවේ සහ විශ්වවිද්‍යාල පාලක සභාවේ අනුමැතිය මත ලියාහැරීමට කටයුතු කර ඇත. | හිඟහිටි අයකිරීමට ප්‍රමාදයකින් තොරව කටයුතු කළ යුතුවේ. |

### 1.6.2 ගෙවියයුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුද්ගලයන් 43 දෙනෙකුට ගෙවිය යුතු රු.497,879 ක මුදලක් වර්ෂ 01 සිට 02 ක කාලපරාසයක් තුල නිරවුල් කිරීමකින් තොරව පැවතුනි. | වසර 02 ඉක්මවූ එම අගයන් විශ්වවිද්‍යාලයේ ආදායමට ගැනීමට කටයුතු කරනු ලැබේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ගෙවිය යුතු විවිධ හේතූන් මත නොගෙවූ රු.201,823.50 ක මුදල ගෙවීමට කටයුතු කරනු ලැබේ. | ගෙවියයුතු අගයන් පියවීමට ප්‍රමාදයකින් තොරව කටයුතු කළ යුතුවේ. |

**1.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | නීති, රීති, රෙගුලාසි | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 99 වන වගන්තිය | කුමන හෝ මූලාශ්‍රයන්ගෙන් වුවත් උසස් අධ්‍යාපන ආයතනයන් වෙත ලද ලැබීම්, විශ්වවිද්‍යාල අරමුදල වෙත බැරකළ යුතුවේ. කෙසේවුවත්, පීඨ මඟින් පවත්තවනු ලබන ස්වයං මූල්‍යකරණ පාඨමාලාවන් වලට අදාලව රු.115,809,743 ක ශේෂයක් ගිණුමේ පැවති අතර ඒවා විශ්වවිද්‍යාල අරමුදලට බැර කර නොතිබුණි. | විශ්වවිද්‍යාලය සතු රු**.** 115,809,743 ක් වන ස්වයං මූල්‍යකරණ ස්ථාවර තැන්පතු හා ලැබියයුතු අගය සැකසී ඇත්තේ විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලබන ස්වයං මූලයකරණ පාඨමාලවන්ගෙන් ලත් මුදල්**,** සිසුන්ගෙන් ලත් වෙනත් ලැබීම් සහ ස්වයං මූලයකරණ ස්ථාවර තැන්පතුවෙන් ලද සමුච්චිත පොලියෙහි එකතුවෙනි. මෙම ස්ථාවර තැන්පතු අවශ්‍ය අවස්ථාවන්හිදී එම ස්වයං මූලයකරණ පාඨමාලාවන්හි ක්‍රියාකාරකම් සඳහා ප්‍රදයෝජනයට ගනු ලැබීය.කෙසේවෙතත්, මේ සඳහා විශ්වවිද්‍යාලයට වන දායකත්වය වෙන් වෙන් වශයෙන් මූල්‍ය වාර්තාවනන්හි පෙන්නුම් කරනු ලබන අතර ඒ සඳහා වෙනම බැංකු ගිණුමක්ද පවත්වාගෙන යනු ලැබේ. | විශ්වවිද්‍යාල පනත අනුව පීඨ මඟින් පවත්තවනු ලබන ස්වයං මූල්‍යකරණ පාඨමාලාවන්ගෙන් ලත් මුදල් විශ්වවිද්‍යාල අරමුදලට බැර කළ යුතු වේ. |
| (ආ)විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ XXVI පරිච්ඡේදයේ 2.1 වගන්තිය | මූල්‍ය වර්ෂය අවසාන දිනට විශ්වවිද්‍යාලයේ ඇති සියළුම ස්ථාවර වත්කම් මෙන්ම ගබඩාද භාණ්ඩ සමීක්ෂණය සඳහා පත්කල මණ්ඩලයක් මගින් භෞතිකව සත්‍යාපනය කළ යුතු වේ. කෙසේවුවත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව රු.**745,237,324** ක් වටිනා විශ්වවිද්‍යාලයේ විද්‍යාගාර හා ඉගැනුම් උපකරණ, වාහන හා ලොගුන් භෞතිකව සත්‍යාපනය කර නොතිබුණි. | සටහන් කර ගන්නා ලදී. විමසුමේ සඳහන් අයිතමයන් සමීක්ෂණය සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් පත් කරනු ලැබේ. | ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක් මගින් අයිතමයන් සමීක්ෂණය සඳහා කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අංක 04/2013 හා 2013 අප්‍රේල් 10 දිනැති ආයතන චක්‍රලේඛයෙන් සංශෝධිත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ XXVI පරිච්ඡේදයේ 3.3 වගන්තිය. | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් පැවැත්විය යුතු අතර එම වාර්තාව 2018 මාර්තු 17 දිනට පෙර විගණකාධිපතිට ඉදිරිපත් කළ යුතුවේ. කෙසේවුවත්, 2017 වර්ෂය අවසානයට වූ පුස්තකාල පොත් සම්බන්ධයෙන් වන වාර්තාව 2019 මැයි 13 වන දින දක්වාම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | සටහන් කරගන්නා ලදී. 2017 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය 2018 වර්ෂයේ සිදුකරන ලද අතර වාර්තාව අදාල අංශය වෙත භාරදී ඇත. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පුස්තකාල හා තොරතුරු විද්‍යාව සඳහා වන ස්ථාවර කමිටුව (SCOLIS) මගින් පුස්තකාල පොත් සමීක්ෂණය වසර 5කට වරක් සිදු කළයුතු බවට කරන ලද නිර්දේශය අනුව 2018 වර්ෂය සඳහා වන භාණ්ඩ සමීක්ෂණය 2019 වර්ෂයේ පවත්වා නොමැත. | 2017 අවසන් දිනට වූ පුස්තකාල පොත් සම්බන්ධයෙන් වන වාර්තාව විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ඈ)විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ XXVI පරිච්ඡේදයේ 3 හා 4 වගන්තිය | 2017 වර්ෂයේ වාර්ෂික තොග සමීක්ෂණ මණ්ඩලයේ වාර්තාව අනුව ප්‍රයෝජනයට ගත නොහැකි ද්‍රව්‍ය අපහරණය කිරීම 2019 අප්‍රේල් 12 දින දක්වාම සිදුකර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණය මගින් හඳුනා ගත් ප්‍රයෝජනයට ගත නොහැකි අබලි ද්‍රව්‍ය අපහරණය කිරීමට කමිටුවක් පත්කර ඇත. | ආයතන සංග්‍රහය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව සම්බන්ධයෙන් නොපමාව කටයුතු කළ යුතුය. |
| (ඉ)ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 571 | එකතුව රු.7,999,618 ක් වටිනා ආපසු ගෙවිය යුතු තැන්පතු 49 ක් වර්ෂ 2 සිට වර්ෂ 5 කාලයක් දක්වා පැවතුණි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම මේ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | වර්ෂ 2 ඉක්මවූ එම තැන්පතු විශ්වවිද්‍යාලයේ ආදායම් යටතට ගැනීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව නොපමාව කටයුතු කළ යුතුය. |
| (ඊ)අංක IAI/2002/02 හා 2002 නොවැම්බර් 28 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | මෙය දීර්ඝ කාලීන හා කාලය වැයවක කටයුත්තක් වන බැවින් පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණය සම්පූර්ණ කිරීමට සැලකිය යුතු කාලයක් අවශ්‍ය කෙරේ. තවද මෙම ලේඛණය 2019 වර්ෂයේ අවසාන වන විට සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ. | චක්‍රලේඛය ප්‍රකාරව ලේඛණ පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ)අංක 10/2017 හා 2017 ජූලි මස 10 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ ලිපිය. | සියළුම කාර්යමණ්ඩලය තම පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සටහන් කළ යුතුවේ. කෙසේවුවත්, අධ්‍යන කාර්යමණ්ඩලය තම පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු යන්ත්‍රයේ සටහන් කිරීම ප්‍රතික්ෂේප කර ඇති අතර මේ සම්බන්ධයෙන් සතුටුදායක පාලන ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි. | ශ්‍රී ලංකාවේ පවතින විශ්වවිද්‍යාල පද්ධතියෙහි පොදු සම්මතයක් ලෙස අධ්‍යන කාර්ය මණ්ඩලය පැමිණීම හා පිටවීම සටහන් නොකරයි. මෙම ගැටළුව සෑම විගණණ වාර්තාවකම ඇතුලත් වුවද, මේ සඳහා නව ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට වෑයම් කිරීම හේතුවෙන් විවිධ වූ ගැටළුවලට මුහුණ දීමට විශ්වවිද්‍යාල පද්ධතියට සිදුවී ඇත. | ආයතන සංග්‍රහය සහ චක්‍රලේඛණ ප්‍රතිපාදන ප්‍රකාරව පැමිණීම හා පිටවීම සටහන් කිරීමට කටයුතු කළ යුතුය.. |
| (ඌ)අංක 07/2016 හා 2016 සැප්තැම්බර් 22 දිනැති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛ ලිපිය. | නිවාඩු දින ගෙවීමක් සඳහා වලංගු වීමට ප්‍රසිද්ධ නිවාඩු දිනකදී හෝ සති අන්තයේදී පැය අටකට (08) නොඅඩු කාලයක් විශ්වවිද්‍යාලයේ පරිපාලන නිලධාරීන් විසින් රාජකාරී කර තිබිය යුතුවේ. කෙසේවෙතත්, එලෙස පැය 08 ක කාලයක් සම්පූර්ණ නොකළ නිලධාරීන් සඳහා රු.98,794 ක අර්ධ නිවාඩු දින ගෙවීම් සිදුකර තිබුණි. | මෙම ගෙවීම් සිදුකර ඇත්තේ චක්‍රලේඛය පදනම් කරගෙනය.එසේ වුවත්, මේ සඳහා ප්‍රතිශෝධනයන් සිදු කර ඇති අතර මෙම නව චක්‍රලේඛය 2018 සැප්තැම්බර් මස සිට ක්‍රියාත්මක කිරීමට නියමිතය. චක්‍රලේඛයට පටහැනිව කරන ලද ගෙවීම් නැවත අයකරගැනීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛයට පටහැනිව කරන ලද ගෙවීම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (එ)පාලක සභාව විසින් 2018 මැයි 26 දින 212 වන රැස්වීමේදී අනුමත කළ උත්තර පත්‍ර ඇගයීමේ මාර්ගෝපදේශයේ 4.2 ඡේදය | උත්තර පත්‍ර පරීක්ෂා කිරීයම් දි, පළමු පරීක්ෂණ කටයුතු වෙනුවෙන් රතු තීන්ත භාවිතා කළ යුතුය. එහෙත් පරීක්ෂා කළ නියැදි උත්තර පත්‍ර 11 අතුරින් 07ක්ම පරීක්ෂා කිරීම සඳහා පැන්සල් භාවිතා කර තිබුණි. | සටහන් තබා ගන්නා ලදී. එම උත්තරපත්‍ර පැකට්ටුවේ මුලට පිරික්සුමේ ලැයිස්තුවක් ඇමිණීම සඳහා කටයුතු සිදු කරනු ලබන අතර එම ලැයිස්තුව අදාල දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කොට විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු වේ. මෙම ක්‍රියාවලිය නිසි ලෙස ක්‍රියාත්මක කිරීමේ අරමුණින් සෑම පීඨයක් වෙතම මෙය සන්නිවේදනය කිරීමට නියමිතය. | මාර්ගෝපදේශ අනුගමනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඒ)පාලක සභාව විසින් 2018 මැයි 26 දින 212 වන රැස්වීමේදී අනුමත කළ උත්තර පත්‍ර ඇගයීමේ මාර්ගෝපදේශ යේ 4.3 ඡේදය | උත්තර පත්‍ර පරීක්ෂා කිරීයම් දි, දෙවන පරීක්ෂණ කටයුතු වෙනුවෙන් කොළ තීන්ත භාවිතා කළ යුතුය. එහෙත් පරීක්ෂා කළ නියැදි උත්තර පත්‍ර 11 අතුරින් 05ක්ම පරීක්ෂා කිරීම සඳහා පැන්සල්, රතු තීන්ත හා නිල් තීන්ත භාවිතා කර තිබුණු අතර උත්තර පත්‍ර 3ක් දෙවන පරීක්ෂණ සිදු කර නොතිබුණි. තවද, ප්‍රශ්නයේ යම්කිසි වූ කොටසක් වෙනුවෙන් වෙන්කර ඇති ලකුණු සංඛ්‍යාව, සහ එක් එක් ප්‍රශ්නය වෙනුවෙන් වෙන්කර ඇති මුළු ලකුණු සංඛ්‍යාව, උත්තර පත්‍රයේ සඳහන් කළ යුතු වීම හෝ මාර්ගෝපදේශයේ සඳහන් ලකුණුම යෙදුවේ නම් ඒ බව පෙන්වීමට හරි ලකුණ යෙදිය යුතු වේ. කෙසේවුවත්, ලබාගත් නියැදි උත්තර පත්‍ර 11න් උත්තර පත්‍ර 07 කම මෙම ක්‍රියාමාර්ග අනුගමනය කර නොතිබුණි. | සටහන් තබා ගන්නා ලදී. එම උත්තරපත්‍ර පැකට්ටුවේ මුලට පිරික්සුමේ ලැයිස්තුවක් ඇමිණීම සඳහා කටයුතු සිදු කරනු ලබන අතර එම ලැයිස්තුව අදාල දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කොට විභාග දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතු වේ. මෙම ක්‍රියාවලිය නිසි ලෙස ක්‍රියාත්මක කිරීමේ අරමුණින් සෑම පීඨයක් වෙතම මෙය සන්නිවේදනය කිරීමට නියමිතය. | මාර්ගෝපදේශ අනුගමනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඔ)පාලක සභාව විසින් 2018 මැයි 26 දින 212 වන රැස්වීමේදී අනුමත කළ උත්තර පත්‍ර ඇගයීමේ මාර්ගෝපදේශ යේ 1.8 ඡේදය | දෙපාර්තමේන්තු කාර්යාලයේ තබා ඇති කථිකාචාර්යවරයාගේ/ ප්‍රායෝගික පරීක්ෂණ ලේඛණයන්හි එම කථිකාචාර්යවරයා විසින් අදාල දේශනය අවසන් වූ විට ඒ බව තහවුරු කිරීමට එහි අත්සන් තැබිය යුතු වේ. කෙසේවුවත්, සමාලෝචිත වර්ෂයේදී එවැනි ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි. | සටහන් තබා ගන්නා ලදී. මෙම ගැටළුව ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරනු ලැබේ.රෙගුලාසි වල දක්වා ඇති අයුරින් කටයුතු කරගෙන යාම සඳහා අදාල උපදෙස් දෙනු ලැබේ. | මාර්ගෝපදේශ අනුගමනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 57,517,296 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 442,000,801ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 384,483,504 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන සඳහා වන ක්‍රමක්ෂය රු.483,444,748 ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ මෙම විශ්වවිද්‍යාලයේ භාණ්ඩාගාර ප්‍රදාන හා මහපොළ හා ශිෂ්‍යාධාර ප්‍රධාන වැනි ආදායම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 16 හා 13 න් ඉහළ ගොස් තිබූ අතර සමාලෝචිත වර්ෂයේ වෙනත් ආදායම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 42 න් අඩුවී තිබුණි.

සමාලෝචිත වර්ෂයේ මෙම විශ්වවිද්‍යාලයේ පෞද්ගලික පඩිනඩි, ක්ෂය හා සිසුන්ට දෙන මූල්‍යාධාර වැනි වියදම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 20, 27 හා 13 න් ඉහළ ගොස් තිබූ අතර සමාලෝචිත වර්ෂයේ අළුත්වැඩියා වියදම ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 38 න් අඩුවී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

---

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

---

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| බැඳුම්කර ගිවිසුම් උල්ලංඝනය කළ කථිකාචාර්යවරයකුගේ බැඳුම්කර වටිනාකම අයකිරීමට වගකිවයුතු නිලධාරීන්ගේ නොසැලකිල්ල හේතුවෙන් වසර 06 කට වඩා වැඩිකාලයක් ගතවීම නිසා විශ්වවිද්‍යාලයට රු.මිලියන 1.73 ක පාඩුවක් සිදුවී තිබුණි. එම නිලධාරීන්ට විරුද්ධව 2019 මැයි 13 දක්වාම ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | 2019 පෙබරවාරි 02 දින පැවති 224 වන විශ්වවිද්‍යාල පාලක සභා රැස්වීමේදී ගත් තීරණයක් අනුව, මෙම ගැටළුව විශ්වවිද්‍යාල කොමිෂන් සභා විධිවිධාන පරිදි ඒ පිළිබඳව පැහැදිලි කිරීම් සිදුකර ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී. එම මගපෙන්වීම් ලැබුනු පසු ඒ අනුව ක්‍රියාත්මක කිරීමට නියමිතය. | වගකියයුතු නිලධාරීන්ගෙන් පාඩුව අයකිරීමට කටයුතු කළ යුතු වේ. |

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

---

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) විශ්වවිද්‍යාලයේ භාහිර ශිෂ්‍යයින් සඳහා 2018 වර්ෂයේ පවත්වන ලද විභාගවල ප්‍රතිපල මාස 5 සිට 9 ක ප්‍රමාදයකින් පසු නිකුත් කර තිබුණි.<br><br>(ආ)භාහිර ශිෂ්‍යයින්ගේ ශිෂ්‍ය අත්පොත අනුව උපාධියක් සම්පූර්ණ කිරීමේ කාලය අවම වශයෙන් අධ්‍යන වර්ෂ 3කි. කෙසේ වෙතත්, කණ්ඩායම් 7ක ලියාපදිංචි සිසුන්ට තම අධ්‍යන කටයුතු අවසන් කිරීමට වර්ෂ 04 සිට වර්ෂ 06 ක කාලසීමාවක් ගතවී තිබුණි. | අප විසින් උත්තර පත්‍ර ඇගයීම් කමිටුවක් **(panel marking system)** දැනටමත් නිර්දෙශ කර ඇති අතර මාස තුනක් ඇතුලත ප්‍රතිඵල නිකුත් කළ යුතු වේ. මෙම තීරණය සඳහා අනුගත වීමට කලා හා සංස්කෘතික පීඨය සහ වාණිජ හා කළමණාකරණ පීඨ වෙත දැනුම් දෙනු ලැබීය. මාස තුනක් ඇතුලත ප්‍රතිඵල නිකුත් කිරීමට ඔවුන් අපොහොසත් වුවහොත් උත්තර පත්‍ර ඇගයීම සඳහා වන ගෙවීම් වැළැක්වීමට අනාගතයේදී පියවර ගනු ලැබේ. මෙමගින් නියමිත කාල පරාසයන් තුල උපාධී අවසන් කිරීම තහවුරු කෙරේ. දමම ක්‍රියාමාර්ගගයන් නිසියාකාරව කරගෙන යාම උදෙසා අධ්‍යක්ෂක/ බාහිර උපාධි හා වෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථානය **(CEDPL)** හා සහකාර ලේඛකාධිකාරී/බාහිර උපාධි හා වෘත්තීය අධ්‍යාපන මධ්‍යස්ථානය **(CEDPL)** වෙත අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. | භාහිර උපාධි ප්‍රතිඵල මාස 3ක් ඇතුලත නිකුත් කිරීමට කටයුතු කළ යුතු වේ.<br><br>ශිෂ්‍ය මාර්ගෝපදේශ අත්පොතේ ඇති විධිවිධාන ප්‍රකාරව උපාධි වැඩසටහන් නියමිත කාලය ඇතුළත සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඇ)2017/2018 අධ්‍යන වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ පීඨ 6 ක් සඳහා බඳවා ගැනීමට අනුමත ප්‍රමාණය සිසුන් 1791 ක් වුවද, එම අධ්‍යන වර්ෂය සඳහා සිසුන් 1146 ක් හෙවත් සියයට 64 ක් පමණක් බඳවාගෙන තිබුණි. 2017/2018, 2016/2017 හා 2015/2016 යන අධ්‍යන වර්ෂවල ව්‍යවහාරික | **Z-score** අගය මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ඔවුන්ට ලැබෙන ශිෂ්‍ය අයදුම්පත් සංඛ්‍යාව මත, අප විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි කර ගත යුතු ශිෂ්‍ය ලැයිස්තුව ඉදිරිපත් කරන අතර, ලියාපදිංචි වන | සිසුන් බඳවා ගැනීම ප්‍රශස්ථ මට්ටමක පවත්වා ගැනීම තුලින් විශ්වවිද්‍යාලයේ උපරිම ධාරිතාව උපයෝජනය |

| | | |
|---|---|---|
| විද්‍යා පීඨය සඳහා බඳවා ගැනීමට අනුමත ශිෂ්‍ය සංඛ්‍යාව පිළිවෙලින් 300,300 හා 350 වුවද සිසුන් 209,259 හා 205 ක් පමණක් බඳවාගෙන තිබුණි. එය සියයට 58 ක් තරම් අඩුඅගයක් ගෙන තිබුණි. | ශිෂයා සංඛ්‍යාව සම්බන්ධව ක්‍රියාකිරීමට අප විශ්වවිද්‍යාලයට කිසිදු බලයක් නැත. එහෙත් එලෙස ශිෂ්‍ය ලැයිස්තුව ලැබුණද, ශිෂ්‍යයින් වෙත වෙනත් විශ්වවිද්‍යාලයන්හි පුරප්පාඩු පිරවීමේදී, ඇති වන අවස්ථාවන් සඳහා ශිෂ්‍යයින්ගේ රුචිකත්වය මත එවැනි විශ්වවිද්‍යාල වෙත අයදුම් කර ඒවා ලියාපදිංචි වීම සිදු කෙරේ. ඒ අනුව, ලියාපදිංචි වන සිසුන් සංඛ්‍යාව පිළිබඳව පාලනයක් අපහට කළ නොහැකි වේ. | කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින්, කලා සහ සංස්කෘතික පීඨය, කළමනාකරණ සහ වාණිජ පීඨය, ඉස්ලාම් අධ්‍යයනය සහ අරාබි භාෂා පීඨය ව්‍යවහාරික විද්‍යා පීඨය, ඉංජිනේරු හා තාක්ෂණ පීඨය යන පීඨ සඳහා, උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් සංඛයාව : ස්ථිර ගුරු මණ්ඩල අනුපාතය මත හඳුන්වා දී ඇති මිණුම් ලකුණ මත පැවතිය යුතු අනුපාතයන් වනුයේ 18:1 සහ 10:1 වශයෙනි. කෙසේ වෙතත්, විශ්වවිද්‍යාලය විසින් ඉහත අනුපාතය, ඉහත මිණුම් ලකුණට පටහැනිව 19:1 සිට 49:1 දක්වා වූ අනුපාතයෙන් පවත්වාගෙන ගොස් තිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස, ඉගැන්වීම් හා ඉගෙනුම් අනුපාතය ප්‍රමාණවත් ලෙස ආවරණය කර ගැනීමට නොහැකි වී තිබුණි. | නියමිත කාල සීමාවේදී එනම්, 2019 වර්ෂයේ ජුනි මසට පෙර අවශ්‍ය නියමිත සේවක සංඛ්‍යාවන් ඉල්ලුම් කිරීමට කටයුතු කෙරුණි. කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව මගින් වැඩි සේවක පුරප්පාඩු සංඛ්‍යා ප්‍රමාණයක් අනුමත කළ පසු, එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට පියවර ගනු ලැබේ. | සිසුන් හා ගුරු කාර්ය මණ්ඩල අනුපාතය අනුව කාර්යමණ්ඩල අනුමැතිය ලබා ගැනීමටත් එම සේවක පුරප්පාඩු පිරවීමටත් පියවර ගත යුතුය. |
| (ඉ) **ශ්‍රී ලංකා** ඉංජිනේරු ආයතනය (IESL) මගින් ඉංජිනේරු උපාධි පාඨමාලාවන් ඇගයීම සහ පිළිගැනීම සඳහා වන අනුමැතිය පිරිනැමීම, දේශිය විදේශිය ඉංජිනේරු වෘත්තිකයන් සම්බන්ධව අවශ්‍ය පිළිගැනීම ලබා දීම සිදු කරයි. මේ අනුව, විශ්වවිද්‍යාලය විසින් ඉංජිනේරු පීඨය ආරම්භ කළ 2013 පෙබරවාරි මස 05 වන දින සිට, විද්‍යුත් හා ඉලෙක්ට්‍රෝනික ඉංජිනේරු විද්‍යාව, යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව යන උපාධින් සඳහා **ශ්‍රී ලංකා** ඉංජිනේරු ආයතනය මගින් ලබා දෙනු ලබන පිළිගැනීමේ අනුමැතිය ලබා ගෙන නොමැත. මේ නිසා 2011/2012 සහ 2012/2013 අධ්‍යන වර්ෂවල උපාධිය අවසන් කළ උපාධිධාරීන් 87 දෙනෙකුට මෙම IESL පිළිගැනීම නොමැතිව වෘත්තීය ඉංජිනේරුවකු ලෙස කටයුතු කිරීමට හැකියාවක් නොමැත. | විද්‍යුත් හා ඉලෙක්ට්‍රෝනික ඉංජිනේරු විද්‍යාව, යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව යන උපාධින් පිළිගැනීම සම්බන්ධ තීරණය නැවත සලකා බලන ලෙස දක්වමින් **ශ්‍රී ලංකා** ඉංජිනේරු ආයතනය (IESL) වෙත අභායාචකයක් 2018 ඔක්තෝම්බර් මස ඉදිරිපත් කරුනු ලැබීය.එම අභියාචනයට **ශ්‍රී ලංකා** ඉංජිනේරු ආයතනය (IESL) විසින් දක්වන ප්‍රතිචාරය අපේක්ෂාවෙන් පීඨය සිටී. | විද්‍යුත් හා ඉලෙක්ට්‍රෝනික ඉංජිනේරු විද්‍යාව, යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව යන උපාධීන් සඳහා **ශ්‍රී ලංකා** ඉංජිනේරු ආයතනයේ (IESL) පිළිගැනීම ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඊ) සමාලෝචිත වර්ෂයේ පැවති උපාධි ප්‍රදානෝත්සවයේදී උපාධි සහතික ලත් පීඨ 5ක උපාධිධාරීන්ගෙන් ලබාගන්නා ලද තොරතුරු අනුව, විශ්වවිද්‍යාලයේ උපාධිධාරීන්ගේ රැකියා නියුක්තිය සියයට 39 දිට 83 දක්වා පරාසයක පැවතුනි. | සමහර පීඨ තුල ගැහැණු උපාධි අපේක්ෂිකාවන් ඉහළ පිරිසක් සිටින අතර ගැහැණු ගැහැණු උපාධිධාරින් උපාධිය ලබා ගත්තද ඔවුන් සියලු දෙනාම රැකියාවල නිරත නොවීම වැදගත් කරුණක් ලෙස සඳහන් කළ යුතුය. උපාධිධාරීන් පිළිබඳ සේවා නියුක්තිකත්වය ගණනය කිරීමේදී මෙම කරුණ පිළිබඳවද අවධානය යොමු කළ යුතුය. | නිපුණතා පදනම් අධ්‍යාපනයක් තුලින් පාඨමාලාවේ ගුණාත්මකභාවය හා අදාලත්වය වැඩිකර ඒ තුලින් උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය වැඩි කිරීමට පියවර ගත යුතුය. |
| (උ)විශ්වවිද්‍යාල අන්තර්ජාතික හා දේශීය ශ්‍රේණිගත කිරීම් අනුව, 2018 වර්ෂය අවසානයේදී 4000 ට අඩු ස්ථානයක් ලභාකර ගැනීමට අපේක්ෂා කළද විශ්වවිද්‍යාලයට අත්කරගැනීමට හැකිවී තිබුණේ පිළිවෙලින් 9004 වන හා 17 වන ස්ථානයන්ය. තවද, ඉකුත් වර්ෂයේදී විශ්වවිද්‍යාලය විසින් 8510 වන හා 15 වන ස්ථානයන් පිළිවෙලින් අත්කරගෙන තිබුණු අතර එමගින් විශ්වවිද්‍යාලය පසුගිය වසරට සාපේක්ෂව ශ්‍රේණිගත කිරීම්වල පසුපසට ගොස් ඇති බව පෙන්නුම් කෙරේ. | සෑම පීඨයක් සඳහාම ඉගෙනුම් කළමණාකරන පද්ධතියන් ස්ථාපිත කිරීම (Learning Management Systems), විශ්වවිද්‍යාලයේ විද්‍යුත් ගබඩා ප්‍රතිසංස්කරණය කිරීම (e-repository of the University), සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සහ උපදේශක කමිටුවක් (ICT advisory board) පිහිට වූ අතර මෙමගින් විශ්වවිද්‍යාල වෙබ්අඩවි අඛණ්ඩ පරීක්ෂාවට ලක් කර එමගින් විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීමට ඇති වන්නා වූ බලපෑම හදුනා ගැනීමත් තුලින් විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් වල අදාල ඉලක්කය වෙත ලභාවීමට කටයුතු කර තිබේ. මෙම විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම හා QS මගින් සංඛ්‍යාත්මක දත්ත පිළිඹිබු කරන අතර මේවායෙහා ඇති අඩුලුහුඩුකම හේතුවෙන් මෙම දත්තයන්හි සංසන්දනාත්මකභාවයක් නොමැත. එමනිසා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් රාජ්‍ය විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදයක් හදුන්තවා දීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කරමින් සිටී. | විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් වලදී අපේක්ෂිත ඉලක්කය ලභා කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3 නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකරණයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) 2017 ජූලි මස 10 වන දින තාක්ෂණික පීඨය විසින් රු. 1,043,075 ක් වියදම් දරා එච්. පී. සර්වර් පද්ධතියක් (HP Server) මිල දී ගැනීමට කටයුතු කර ඇති අතර, එය 2019 අප්‍රේල් මස 25 වන දින තෙක් මිල දී ගත් අරමුණ වෙනුවෙන් භාවිතා කර නොතිබුණි. | තාක්ෂණ පීඨය විසින් මෙම සර්වර් පද්ධතිය (server system) භාවිතයට ගැනීම 2017 වසරේ ජූලි මස 10 වන දින සිට සිදු කරනු ලැබීය. මෙම සර්වර් පද්ධතිය මගින් ශිෂ්‍යාන්හට බොහෝ සේවාවක් ලබා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රෙවේශයන් ලබා දෙනු ලැබීය. 2019 වසරේ පෙබරවාරි මස පැවති ශිෂ්‍යය අධ්‍යාන නිවාඩු සහ 2019 වසරේ මාර්තු/අප්‍රේල් මාස තුල පැවති අවසන් වාර පරික්ෂණ කටයුතු වෙනුවෙන් මෙම සර්වර් පද්ධතිය තාවකාලිකව නවතාලීමට සිදුවිය. මෙම වැඩකටයුතු හා වාර පරීක්ෂණ අවසන් වූ විගස | මෙම සර්වර් පද්ධතිය ප්‍රමාදයකින් තොරව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුවේ. |

| | | |
|---|---|---|
| | මෙම සර්වර් පද්ධතිය නැවත භාවිතයට ගැනීමට නියමිතය. | |
| (ආ)2018 වර්ෂයේ දී, තොරතුරු සන්නිවේදන තාක්ෂණ දෙපාර්තමේන්තුව සඳහා ජංගම යෙදවුම් සංවර්ධන රසායනාගාරයක් (mobile application development laboratory) ස්ථාපිත කිරීම වෙනුවෙන් AHEAD හා ශ්‍රී ලංකා රජයේ අරමුදල් හරහා රු.523,998 බැගින් අයිමැක් පරිගණක (iMac Computers) 60ක් මිල දී ගැනීම සඳහා රු. මිලියන 31.3ක් ගෙවා තිබුණි. මෙහිදී 2018 දෙසැම්බර් මස 27 වන දින එම පරිගණක බෙදාහැර තිබුණද 2019 මැයි මස 13 වන දින තෙක් අදාල පරිගණක සඳහා අවශය යටිතල පහසුකම් සපයා යනාතිබීම හේතුවෙන් එම පරිගණක අදාල අරමුණු වෙනුවෙන් භාවිතා කිරීමට නොහැකි වී තිබුණි. | රසායනාගාරය වෙන් කිරීමේ කටයුතු (යටිතල පහසුකම්) අයි මැක් පරිගණක (iMac Computers) සවි කිරීම සඳහා අවසන් කර තිබේ. මෙය නිවැරදි ස්ථානය වන බැවින් රසායනාගාරයේ මෙම පරිගණක සවිකිරීමට කටයුතු කර ඇත. මෙම පරිගණකවලට අදාල විෂය ක්ෂේත්‍රයන් පිළිබඳව වූ ප්‍රායෝගික සැසියන් ඉදිරියේදී පටන් ගැනීමට නියමිත අධ්‍යන වාරයේදී ආරම්භ කිරීමට කටයුතු සූදානම් කර තිබේ. එම වැඩ සටහන් 2019 වර්ෂයේ මැයි මස 06 වන දින ආරම්භ කිරීමට තීරණය කර තිබේ. කෙසේ වුවත්, පාස්කු ඉරු දින එල්ල වූ ත්‍රස්ත ප්‍රහාරයත් සමඟ රටෙහි පැන නැඟී ඇති ආරක්ෂක ගැටලූ මත, අධ්‍යන වාරය ආරම්භ කිරීමට අපේක්ෂා කරන දින පිළිබඳව තීරණය කළ හැකි නොවේ. කෙසේ වුවත්, අධ්‍යන වාරය 2019 වර්ෂයේ ජුනි මස 17 වන දින සිට ආරම්භ කිරීමට නියමිතය. | පරිගණක ප්‍රමාදයකින් තොරව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඇ)ව්‍යවහාරික විද්‍යා පීඨයේ රසායනාගාර අංශයේ ඉදිකිරිම් කටයුතු 2011 ඔක්තෝබර් මස 31 දින ආරම්භ වී 2014 පෙබරවාරි 15 දින රු. 84,156,395 ක පිරිවැයක් දරා සම්පූර්ණ කර තිබුණි. තවද, 2016 වර්ෂයේදී විද්‍යුත් සවිකිරීම් වන සිවිලිම් විදුලි පංකා හා බල්බ වෙනුවෙන් රු.1,856,467ක් වියදම් දරා තිබුණි. කෙසේවෙතත්, මෙම රසායනාගාර 2019 මැයි 13 වන දින දක්වාම අපේක්ෂිත අරමුණ වෙනුවෙන් භාවිතා කර නොතිබූ අතර සුදුසු රසායනාගාර උපකරණ ප්‍රසම්පාදනයේ ඇතිවූ ප්‍රමාදය හේතුවෙන් වසර 2කට වඩා වැඩිකලක් නිශ්ක්‍රීය වීමට ඉඩ හැර තිබුණි. | කානු පද්ධතිය, ගෑස් සහ ජල මාර්ග පද්ධතිය සඳහා මිල කැඳවන ලද අතර ඒවා තාක්ෂණික ඇගයීම් කමිටුවේ ඇගයීමට යටත් කර තිබේ. මෙම ඇගයීම් ක්‍රියාවලිය මෙම මස අවසානයේදී අවසන් වීමට නියමිත අතර 2019 වර්ෂයේ ජුනි මස දෙවන සතියේදී අදාල ටෙන්ඩරය පිරිනැමිය හැකි වේ. තෝරාගන්නා කොන්ත්‍රාත්කරු විසින් අදාල කොන්ත්‍රාත්තුව මාස 2ක් තුල නිමකළ යුතු බැවින් සියළුම රසායනාගාර සැප්තැම්බර් 1 සිට ප්‍රායෝගික පන්ති සඳහා ප්‍රයෝජනයට ගත හැකි වනු ඇත. | රසායනාගාර අංශය ප්‍රමාදයකින් තොරව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුවේ. |

**3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ දුර්වලතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ)කලමනාකරණ හා වාණිජ පීඨය වෙනුවෙන් පිරිවැය රු.මිලියන 112ක් වන ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා වන කොන්ත්‍රාත් කටයුතු 2010 වසරේ දී ප්‍රදානය කර ඇති අතර එහි වැඩ කටයුතු 2014 වර්ෂයේ පෙබරවාරි මස 28 වන දින හෝ ඊට ප්‍රථම අවසන් කිරීමට නියම කර තිබුණි. එම කොන්ත්‍රාත් කටයුතු 2014 වර්ෂයේ අප්‍රේල් මස 20 වන දින අවසන් කළ ද, රු. 2,977,412 ක ප්‍රමාද ගාස්තු (liquidated damages) අදාල ගිවිසුම් ප්‍රකාරව එම කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කාලය දීර්ඝ කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබාගෙන තිබේ. | කොන්ත්‍රාත්කරුගෙන් හෝ වගකිවයුතු නිලධාරීන්ගෙන් ප්‍රමාද ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතුවේ. |
| (a) කොන්ත්‍රාත් ගිවිසුමේ 13.7 වගන්තියට පටහැනිව විශ්වවිද්‍යාල ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීමේදී වෙනස් කළ නොහැකි ප්‍රාථමික අයිතම වෙනුවෙන් කොන්ත්‍රාත්කරුව රු.2,495,837 ක් ගෙවීම් කර තිබුණි.තවද, උපදේශන ගාස්තු ලෙස ගෙවිය යුත්තේ එකතු කළ අගය මත බදු රහිත මුළු කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 5.25 විය යුතුය. කෙසේවෙතත්, විශ්වවිද්‍යාලය මගින් රේටයන් දෙකක් භාවිතා කරමින් මෙම ගාස්තුව ගණනය කර තිබුණි. ඒ හේතුවෙන් උපදේශකවරයාට රු.659,138 ක් වැඩිපුර ගෙවා තිබුණි | එම ගෙවීම උපදේශකවරයාගේ නිර්දේශය පදනම් කරගෙන ගෙවන ලදී. උපදේශක ගාස්තු ගෙවීම ගිවිසුම් ප්‍රකාරව සිදුකර තිබේ. | ගෙවීම් සඳහා සාධාරණත්වය හඳුනාගැනීමට හෝ අධිකාරීබලය නොලත් ගෙවීම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ කාර්යයන් 03 ක් වෙනුවෙන් වාර්ෂික අයවැය තුලින් වෙන්කරන ලද රු.292,500 ක ප්‍රතිපාදන වලින් සියයට 43 සිට 83 ක පරාසයකින් අදාල අරමුණු වෙනුවෙන් උපයෝජනය තර නොතිබුණි. | 2018 මාර්තු හා අප්‍රේල් මාසවල පැවති අනධ්‍යන කාර්ය මණ්ඩලයේ වැඩවර්ජනය සහ සැප්තැම්බර් හා ඔක්තෝබර් මාසවලදී සිසුන් විසින් පරිපාලන ගොඩනැගිල්ල අත්පත්කරගැනීම මෙම ඉතිරිවීම්වලට හේතු විය. එසේම, 2018 වර්ෂය තුල ඉටුකිරීමට තීරණය කර තිබූ සමහර ප්‍රධාන කටයුතු සිදු කිරීමට අපට නොහැකි විය. කෙසේවවත්, 2018 වර්ෂය වෙනුවෙන් ඉටුකිරීමට තිබූ එම කාර්යයන් 2019 වර්ෂයේ මුලදී ආරම්භ කර ඇති අතර ඒ අනුව අරමුදල් උපයෝජනය කරනු ලැබේ. | ප්‍රතිපාදනයන් අදාල අරමුණු වෙනුවෙන් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුවේ. |

**4.2** තිරසර සංවර්ධන අරමුණු

-----------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ---------------- | ------------------------------ | --------------------- |
| නිශ්චිත කටයුතුවල කාර්යසාධනය ඇගයීම සඳහා නිවැරදි සංඛ්‍යානමය දත්ත පැවතීම අත්‍යවශ්‍ය වුවත්, තිරසර සංවර්ධන අරමුණු ලභා කරගැනීම සම්බන්ධයෙන් ඇගයීම සඳහා විශ්වවිද්‍යාලය විසින් නිවැරදි දත්ත එකතුකර පවත්වා ගැනීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. තිරසර සංවර්ධන අරමුණු සඳහා පුහුණු කාර්යමණ්ඩලයක් නොමැති වීම වැනි කාරණාද මේ සඳහා හේතු වී ඇති බව තවදුරටත් නිරීක්ෂණය කෙරේ. | සටහන් කර ගන්නා ලද අතර මෙය විසඳීමට පියවර ගනු ලැබේ. අප දැනටමත් සමහර කටයුතු සිදුකර තිබේ. | ඉලක්ක සකස් කිරීමට හා .තිරසර සංවර්ධන අරමුණු හා ඒවා ලභා කර ගැනීම සඳහා මූලික කාර්යසාධන දර්ශකයන් සකස් කිරීමට කටයුතු කර නොතිබුණි. |